
සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| ඉතිහාසය | 6 | 3 | 05. අපේ අතීත රජවරු<br>II කොටස - දේවානම්පියතිස්ස රජතුමා |




සැකසුම - බෝධිනි අපර්ණා ගුණවර්ධන
පාසල - බප/හො/ සාගරපලන්සූරිය මහා විද්‍යාලය.

- දේවානම්පියතිස්ස රජතුමාගේ පියා මුටසීව රජතුමා ය.
- මුටසීව රජුගෙන් පසු තිස්ස කුමරු රජ විය.
- එකල ඉන්දියාව පාලනය කළේ ධර්මාශෝක නම් අධිරාජයා ය.
- තිස්ස රජතුමා අරිට්ඨ කුමරුගේ මූලිකත්වයෙන් දූත පිරිසක් අධිරාජයා වෙත පිටත් කළේය.
- තිස්ස රජුගේ අභිෂේකයට අවශ්‍ය රාජකීය භාණ්ඩ අධිරාජයා විසින් මෙරටට එවන ලදී

- දේවානම්පියතිස්ස රජතුමාගේ නමට යෙදී තිබෙන ‘**දේවානම්පිය**’ යනු දෙවියන්ට ප්‍රිය වූ යන අදහස දෙයි.
- ධර්මාශෝක රජතුමාගේ අනුග්‍රහයෙන් දේවානම්පියතිස්ස රජතුමා දෙවන වරට අභිෂේක විය
- අනුරාධපුර නගර සීමාව ලකුණු කිරීම සිදු කළේ මෙතුමාගේ පාලන කාලයේ දී ය.


- මිහිඳු හිමි ඇතුළු පිරිස ශ්‍රී ලංකාවට බුදු දහම රැගෙන පැමිණීම මේ රාජ්‍ය සමයේ සිදු විය.



- මිහිඳු මහරහතන් වහන්සේ සහ උන්වහන්සේ සමග මෙරටට වැඩම කළේ ඉට්ඨිය, උත්තිය, සම්බල, බද්ධසාල යන රහතන් වහන්සේලාත් සුමන සාමණේර හිමියන් සහ භණ්ඩුක උපාසක ඇතුළු කණ්ඩායමක් ය

- දේවානම්පියතිස්ස රජු විසින් මිහිඳු හිමියන්ට මහමෙව්නා උයන සහ එහි තිස්සමහාරමය නමින් පන්සලක් ඉදි කර දෙන ලදී.

- සංඝමිත්තා මෙහෙණිය විසින් ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් වැඩම වීම



- මේ පිරිස ශ්‍රී ලංකාවේ දඹකොළපටුන වරායට ගොඩ බසින ලදී
- සංඝමිත්තා මෙහෙණින් වහන්සේ සමග ශිල්ප ශ්‍රේණි දහ අටකට අයත් ශිල්පීන් පිරිසක් ද මෙරටට පැමිණියහ.

- ශ්‍රී මහා බෝධිය අනුරාධපුරයට වැඩමවා මහත් උත්සවශ්‍රීයෙන් රෝපණය කිරීමට දේවානම්පියතිස්ස රජතුමා කටයුතු කළේය.



- අනුරාධපුරයේ පිහිටි ථූපාරාමය ඉදි කළේ දේවානම්පියතිස්ස රජතුමා විසින් ය.



- මුල් කාලයේ දී මිහිදු හිමියන්ගේ උපදෙස් අනුව ථූපාරාමය ඉදි කරන ලද්දේ ධාන්‍යාකාර හැඩයටය

- පසු කාලීනව කරන ලද ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ එය ඝාණ්ඨාකාර හැඩයක් ගනී

- බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුධාතුව ථූපාරාමයේ තැන්පත් කර තිබේ.

- ථූපාරාම දාගැබ වටා ගල්කණු පේළි තුනක් පිහිටා තිබේ

- ඒ ගල්කණු පුරාණ කාලයේ දී දාගැබේ ආරක්ෂාවට ඉදි කළ ගොඩනැගිලිල්කට අයත් ඒවා ය.

- එවැනි ගොඩනැගිල්ලක් හඳුන්වන්නේ වටදාගෙය යනුවෙනි.

- ථූපාරාමයට වටදාගෙයක් ඉදි කර වූයේ වසභ රජතුමා ය.



සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| ඉතිහාසය | 6 | 3 | 05. අපේ අතීත රජවරු<br>II කොටස - දේවානම්පියතිස්ස රජතුමා<br>-- ඇගයීම-- |

**සැකසුම - බෝධිනි අපර්ණා ගුණවර්ධන, බප/හො/ සාගරපලන්සූරිය මහා විද්‍යාලය**

**සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. දේවානම්පියතිස්ස රජුගේ පියා නම් කරන්න

02. එකල ඉන්දියාව පාලනය කළ අධිරාජයා කවුරුන් ද?

03. දේවානම්පියතිස්ස රජු විසින් සිදු කල ආගමික සේවාවන් නම් කරන්න.

04. මිහිදු හිමි සමග පැමිණි පිරිස කවුරුන් ද?

05. දේවානම්පියතිස්ස රජු විසින් ඉදිකල වෙහෙර කුමක් ද?

සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| ඉතිහාසය | 6 | 3 | 05. අපේ අතීත රජවරු<br>II කොටස - දේවානම්පියතිස්ස රජතුමා<br>-- පිළිතුරු-- |

**සැකසුම - බෝධිනි අපර්ණා ගුණවර්ධන, බප/හො/ සාගරපලන්සූරිය මහා විද්‍යාලය**

1) මුටසීව රජතුමා

2) ධර්මාශෝක අධිරාජයා

3) * මිහිඳු හිමි ඇතුලු පිරිස ශ්‍රී ලංකාවට බුදු දහම රැගෙන පැමිණීම මේ රාජ්‍ය සමයේ සිදු විය. දේවානම්පියතිස්ස රජු විසින් මිහිඳු හිමියන්ට මහමෙව්නා උයන සහ එහි තිස්සමහාරාමය නමින් පන්සලක් ඉදි කර දෙන ලදි.

* සංඝමිත්තා තෙරණින් වහන්සේ විසින් මෙරටට වැඩමෙවූ ශ්‍රී මහා බෝධිය අනුරාධපුරයට වැඩමවා මහත් උත්සවශ්‍රීයෙන් රෝපණය කිරීමට කටයුතු කිරීම

* බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුධාතුව තැන්පත් කර ථූපාරාමය අනුරාධපුරයේ ඉදි කිරීම

4) ඉට්ඨිය, උත්තිය, සම්බල, බද්ධසාල යන රහතන් වහන්සේලාත් සුමන සාමණේර හිමියන් සහ භණ්ඩුක උපාසක ඇතුළු කණ්ඩායමක් ය.

5) ථූපාරාමය